ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2018 ඔක්තෝබර් මස 29 දින |

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2018 අගෝස්තු

### සමස්ත නිරීක්ෂණ

2018 අගෝස්තු මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය මන්දගාමීව පැවතුණි. ආනයන වියදම්හි සිදු වූ වර්ධනය අභිබවා අපනයන ආදායම් ඉහළ යෑම හේතුවෙන් මාසය තුළදී වෙළඳ ගිණුමේ හිඟය පෙර වසරේ අගෝස්තු මාසයට සාපේක්ෂව සුළු වශයෙන් අඩු විය. මේ අතර, සංචාරක ඉපැයීම්හි සිදු වූ සුළු වැඩි වීම හා විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල සිදු වූ අඩු වීමත් සමඟ 2018 අගෝස්තු මාසයේ දී ජංගම ගිණුම වෙත වූ අනෙකුත් ලැබීම් තවදුරටත් මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන ඉවත් කරගැනීම සහ අඛණ්ඩ ණය සේවාකරණ ගෙවීම් හේතුවෙන් මාසය තුළදී ගෙවුම් තුලනයේ මූල්‍ය ගිණුම ශුද්ධ ගෙවීම් ප්‍රමාණයක් වාර්තා කළේය. මෙම තත්ත්වයන් සහ සමස්තයක් ලෙස එ.ජ. ඩොලරය ශක්තිමත් වීම හේතුවෙන් විනිමය අනුපාතිකය මත අවප්‍රමාණය වීමේ පීඩනයක් අඛණ්ඩව පැවති අතර, විනිමය අනුපාතිකයෙහි අනිසි අධික විචලනයන් අවම කිරීම සඳහා දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් වීමට මහ බැංකුවට සිදු විය. 2018 අගෝස්තු මස අවසානය වන විට දළ නිල සංචිත එ.ජ.ඩොලර් බිලියන 8.6 ක් විය.

## සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2017 අගෝ. (එ.ජ. ඩො. මිලියන) | 2018 අගෝ. (එ.ජ. ඩො. මිලියන) | වෙනස (%) | 2017 ජන -අගෝ. (එ.ජ. ඩො. මිලියන) | 2018 ජන -අගෝ. (එ.ජ. ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 1,001 | 1,037 | 3.7 | 7,413 | 7,842 | 5.8 |
| ආනයන | 1,857 | 1,887 | 1.6 | 13,597 | 15,083 | 10.9 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -856 | -850 | | -6,184 | -7,240 | |
| සංචාරක ඉපැයීම් | 354 (ආ) | 372 (ඇ) | 4.9 | 2,609 (ආ) | 2,935 (ඇ) | 12.5 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 600 (ඈ) | 534 | -10.9 | 4,820 (ඈ) | 4,777 | -0.9 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඉ) | 76 | -6 | | 328 | 44 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 752 | 198 | | 4,410 | 4,142 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 140 | 75 | | 1,074 | 657 | |
| දිගුකාලීන ණය | 62 | 123 | | 836 | 985 | |
| ඒකාබද්ධ ණය පහසුකම් | 550 | - | | 1,000 | - | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | | 1,500 | 2,500 | |
| ජා.මූ. අරමුදල - විස්තීර්ණ ණය පහසුකම | - | - | | 167 | 252 | |
| විදේශීය සෘජු ආයෝජන (ඊ) | | | | 567 | 1,353 | |
| සමස්ත ශේෂය | | | | 2,175 | 474 | |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික

(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2017 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය

(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2018 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය

(ඈ) සංශෝධිත

(ඉ) ද්විතීයීක සහ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ

(ඊ) සෑම කාලපරිච්ඡේදයක් සඳහාම දත්ත පවතිනුයේ පළමු මාස හය සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ සෘජු ආයෝජන ඇතුළත් වේ

## වෙළඳ ශේෂය

ආනයන වියදම වර්ධනය වීමේ වේගයට වඩා වැඩි වේගයකින් අපනයන ආදායම වර්ධනය වීම හේතුවෙන්, 2018 අගෝස්තු මාසයේ දී වෙළඳ හිඟය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සුළු අඩුවීමක් වාර්තා කළේය. කෙසේ වු ව ද, 2018 වසරේ පළමු මාස අට තුළ සමුච්චිත වෙළඳ හිඟය 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පුළුල් විය.

**රූප සටහන 1: මාසික වෙළඳ ශේෂය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය

**රූප සටහන 2 : මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

2018 අගෝස්තු මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම අඛණ්ඩව තෙවැනි මාසයටත් එ.ජ. ඩොලර් බිලියන ඉක්මවමින් එ.ජ. ඩොලර් මිලියන 1,037 ක් දක්වා ඉහළ ගිය අතර, එය පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 3.7 ක වර්ධනයකි. අපනයන ඉහළ යෑම සඳහා කාර්මික අපනයන ක්‍රියාකාරිත්වය ඉහළ යෑම හේතු වූ අතර, කෘෂිකාර්මික සහ ඛනිජමය අපනයන පහත වැටුණි. කාර්මික අපනයන සැලකූ විට, යුරෝපා වෙළඳපොළ වෙත ඇඟලුම් අපනයනයෙන් ලද ආදායම පහත වැටුණ ද, ඇමෙරිකා එක්සත් ජනපදය සහ ඉන්දියාව, ජපානය, ඕස්ට්‍රේලියාව හා කැනඩාව වැනි සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ වෙතින් වූ ඉල්ලුම ඉහළ යෑම පිළිබිඹු කරමින් 2018 අගෝස්තු මාසයේ දී රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම ඉහළ ගියේය. තව ද, විශේෂයෙන්ම රබර් ටයර් සහ රබර් නිෂ්පාදිත යටතේ වර්ග කර ඇති සියලුම උපකාණ්ඩවල ඉහළ ක්‍රියාකාරිත්වය හේතුවෙන් මෙම මාසය තුළදී රබර් නිෂ්පාදිත අපනයන ආදායම වර්ධනය විය. 2018 අගෝස්තු මාසයේ දී ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, නැව් සහ ගුවන් යානා සඳහා භාවිතා කරන ඉන්ධන අපනයන පරිමාව පහත වැටුණ ද, ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඉන්ධන මිල ගණන් ඉහළ යෑමට සමගාමීව අපනයන මිල ගණන් ඉහළ යෑම මේ සඳහා හේතු විය. සකස් කළ දුම්කොළ සහ විශේෂයෙන්ම පොල් ආශ්‍රිත නිෂ්පාදිත ඇතුළුව එළවළු, පළතුරු සහ ධාන්‍ය සැකසුම් යටතේ වර්ග කර ඇති කාණ්ඩවල අපනයනවල ඉහළ ක්‍රියාකාරිත්වය හේතුවෙන් මෙම මාසය තුළ දී ආහාර, පාන වර්ග හා දුම්කොළ අපනයන ආදායම ඉහළ ගියේය. මීට අමතරව, 2018 අගෝස්තු මාසයේ දී කාර්මික අපනයන ආදායම වර්ධනයට යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ රසායනික නිෂ්පාදිත අපනයන ආදායම් ඉහළයෑම ද දායක විය. කෙසේ වුවද, මෙම මාසය තුළ දී සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් සහ මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ අපනයන ආදායම පහත වැටුණි. මේ අතර, මෙම මාසය තුළ දී සකස් නොකළ දුම්කොළ සහ රබර් හැර කෘෂිකාර්මික අපනයන යටතේ වර්ගකර ඇති කාණ්ඩ සියල්ලකම පාහේ දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් කෘෂිකාර්මික අපනයන ආදායම පහත වැටුණි. තේ අපනයන මිල ගණන් හා පරිමාව යන දෙකෙහිම පහත වැටීම හේතුවෙන් 2018 අගෝස්තු මාසයේ දී තේ අපනයන ආදායම පහත වැටුණි.

කුරුඳු හැර කුළුබඩු යටතේ වර්ගකර ඇති කාණ්ඩ සියල්ලකම පාහේ වූ දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් 2018 අගෝස්තු මාසයේ දී කුළුබඩු අපනයන ආදායම පහත වැටුණි. තව ද, දිසිදි පොල් සහ පොල්තෙල් වැනි පොල්මද ආශ්‍රිත නිෂ්පාදිත අපනයන පහත වැටීම හේතුවෙන් පොල් අපනයන ආදායම පහත වැටුණි. 2018 අගෝස්තු මාසයේ දී ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ අපනයන සඳහා ප්‍රධාන වෙළඳපොළ ලෙස ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය සහ ඉතාලිය පැවති අතර, එම රටවල් වෙත සිදු කරන ලද අපනයන වටිනාකම මුළු අපනයන ආදායමෙන් සියයට 52 ක් පමණ විය.

## සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)

| කාණ්ඩය | 2017 අගෝ. (එ.ජ.ඩො. මිලියන) | 2018 අගෝ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2017 ජන -අගෝ. (එ.ජ.ඩො. මිලියන) | 2018 ජන -අගෝ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **740.1** | **808.0** | **9.2** | **5,562.5** | **6,085.3** | **9.4** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 34.8 | 40.1 | 15.4 | 259.1 | 311.1 | 20.1 |
| සත්ත්ව ආහාර | 4.8 | 7.6 | 56.9 | 50.0 | 73.6 | 47.2 |
| රෙදිපිළි හා ඇඟලුම් | 433.2 | 467.1 | 7.8 | 3,283.4 | 3,451.7 | 5.1 |
| එයින් ඇඟලුම් | 402.3 | 436.2 | 8.4 | 3,088.1 | 3,222.2 | 4.3 |
| රෙදිපිළි | 19.8 | 22.8 | 15.2 | 137.9 | 166.0 | 20.4 |
| වෙනත් රෙදිපිළි සැකසුම් | 11.1 | 8.1 | (27.4) | 57.4 | 63.5 | 10.5 |
| රබර් නිෂ්පාදිත | 71.0 | 80.5 | 13.4 | 538.1 | 584.4 | 8.6 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 25.6 | 24.5 | (4.4) | 166.9 | 195.3 | 17.0 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 32.7 | 37.4 | 14.5 | 242.1 | 295.7 | 22.1 |
| ප්‍රවාහන උපකරණ | 6.4 | 8.7 | 35.2 | 138.1 | 91.1 | (34.0) |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 40.1 | 47.0 | 17.3 | 252.7 | 387.9 | 53.5 |
| රසායනික නිෂ්පාදිත | 12.7 | 16.0 | 25.5 | 96.6 | 114.7 | 18.8 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 11.4 | 11.0 | (2.8) | 90.3 | 92.5 | 2.4 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 4.0 | 4.9 | 21.1 | 28.0 | 19.3 | (31.2) |
| සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 16.5 | 11.2 | (31.9) | 107.0 | 101.9 | (4.7) |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 5.8 | 6.5 | 11.5 | 47.2 | 50.7 | 7.4 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 11.4 | 16.2 | 43.1 | 72.3 | 108.0 | 49.4 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 2.8 | 3.5 | 23.5 | 22.1 | 20.8 | (5.7) |
| වෙනත් | 26.9 | 25.8 | (4.0) | 168.5 | 186.6 | 10.7 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **255.4** | **225.4** | **(11.7)** | **1,815.0** | **1,723.4** | **(5.0)** |
| තේ | 131.3 | 116.1 | (11.6) | 1,002.7 | 970.2 | (3.2) |
| රබර් | 2.6 | 2.7 | 3.2 | 28.7 | 23.0 | (19.7) |
| පොල් | 33.8 | 31.1 | (7.9) | 240.1 | 209.4 | (12.8) |
| කුළුබඩු | 50.2 | 41.6 | (17.2) | 248.7 | 225.6 | (9.3) |
| එළවළු | 2.5 | 2.2 | (12.1) | 19.5 | 18.3 | (6.2) |
| සකස් නොකළ දුම්කොළ | 3.5 | 3.8 | 8.7 | 23.5 | 23.6 | 0.5 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 13.4 | 10.0 | (25.5) | 96.6 | 84.0 | (13.0) |
| මුහුදු ආහාර | 18.0 | 17.9 | (0.2) | 155.4 | 169.4 | 9.0 |
| **3. ඛනිජ හා වෙනත් අපනයන** | **5.2** | **3.9** | **(24.2)** | **35.8** | **33.7** | **(6.0)** |
| **මුළු අපනයන** | **1,000.6** | **1,037.4** | **3.7** | **7,413.4** | **7,842.4** | **5.8** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය

රූප සටහන 3 : මාසික ආනයන ක්‍රියාකාරිත්වය




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

2018 අගෝස්තු මාසයේ දී ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,887 ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 1.6 කින් ඉහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන්ම ඉන්ධන සහ පෞද්ගලික භාවිතය සඳහා වන රථවාහන ආනයන වියදම ඉහළ යෑම හේතු විය. අන්තර් භාණ්ඩ සැලකූ විට, බොරතෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයන පරිමාව පහත වැටුණ ද, ආනයන මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් ඉන්ධන ආනයන වියදම කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. මීට අමතරව, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, රසායනික නිෂ්පාදිත, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ ඛනිජ නිෂ්පාදිත ආනයන වියදම් කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. කෙසේ වුවද, මෙම කාලපරිච්ඡේදය තුළ දී රත්‍රන්, මූල ලෝහ සහ තිරිඟු හා ඉරිඟු ආනයන වියදම් පහත වැටුණි. පාරිභෝගික භාණ්ඩ සැලකූ විට, ප්‍රධාන වශයෙන් සිලින්ඩර ධාරිතාව 1,000ට අඩු මෝටර් රථ, දෙමුහුන් රථ සහ විද්‍යුත් වාහන ආනයන ඉහළ යෑම හේතුවෙන් 2018 අගෝස්තු මාසයේ දී පෞද්ගලික භාවිතය සඳහා වන රථවාහන ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව අඛණ්ඩව නවවැනි මාසයටත් ඉහළ ගියේය. කෙසේ වුවද, ආනයන ඉහළ යෑම හේතුවෙන් ගෙවුම් තුලනය මත පවතින පීඩනය සැලකිල්ලට ගනිමින් මහ බැංකුව සහ රජය විසින් රථවාහන ආනයනය සීමාකිරීමට ක්‍රියාමාර්ග ගණනාවක් ගන්නා ලදී. මේ අනුව, සිලින්ඩර ධාරිතාව 1,000ට අඩු මෝටර් රථ, දෙමුහුන් රථ සහ විද්‍යුත් වාහන මත වන බදු 2018 අගෝස්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි ඉහළ නැංවූ අතර 2018 සැප්තැම්බර් 19 දින සිට බලපැවැත්වෙන පරිදි වාණිජ කටයුතු සඳහා භාවිතයට ගනු ලබන රථවාහන හැර අනෙකුත් රථවාහන ආනයනය සඳහා වාණිජ බැංකුවල ණයවර ලිපි විවෘත කිරීමේ දී සියයට සියයක තැන්පතු අවශ්‍යතාවක් පනවන ලදී. තව ද, 2018 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි එම තැන්පතු අවශ්‍යතාවය සියයට දෙසියය දක්වා ඉහළ නැංවූ අතර, දෙමුහුන් වාහනවලට ණය පහසුකම් ලබාදීමේදී වටිනාකම මත අනුපාතය සියයට 70 සිට සියයට 50 දක්වා අඩු කරන ලදී. මේ අතර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබාදීම තාවකාලිකව අත්හිටුවන ලදී. මෙම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සමඟ ඉදිරි මාසවලදී රථ වාහන ආනයන වියදම අඩු වෙතැයි අපේක්ෂා කෙරේ. තව ද,

දේශීය සැපයුම ඉහළ යෑම හේතුවෙන් සහල් ආනයනය පහත වැටුණ ද, කිරි නිෂ්පාදිත, බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත සහ විදුලි සංදේශ මෙවලම් වැනි පාරිභෝගික භාණ්ඩ ආනයන වර්ධනය විය. කෙසේ වුව ද, තෝරාගත් අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත කිරීමේ දී හෝ පිළිගැනීමෙන් පසු ලියවිලි භාරදීමේ (Documents against Acceptance) කොන්දේසි මත සියයට සියයක අවම මුදල් තැන්පතු අවශ්‍යතාවයක් පැනවීම සහ මෙවැනි භාණ්ඩ ආනයනය කිරීම සඳහා ශ්‍රී ලංකා රුපියල් විදේශ විනිමය බවට හුවමාරු කිරීම තහනම් කරමින් බලයලත් අලෙවි නියෝජිතයන්ට නියෝග පැනවීම වැනි මෑතක දී හඳුන්වා දුන් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් ගෙවුම් තුලනය මත ඇති වී තිබෙන පීඩනය අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරෙයි. කෙසේ වුව ද, ආයෝජන භාණ්ඩ යටතේ වර්ගකර ඇති කාණ්ඩ සියල්ලකම පාහේ ආනයන වියදම පහත වැටීම හේතුවෙන් 2018 අගෝස්තු  මාසයේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි. 2018 අගෝස්තු මාසයේ දී ශ්‍රී ලංකාව විසින් භාණ්ඩ ආනයනය කළ ප්‍රධාන රටවල් ලෙස චීනය, ඉන්දියාව, ජපානය, සිංගප්පූරුව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය පැවති අතර, එම රටවලින් සිදුකළ ආනයන සමස්ත ආනයන වියදමෙන් සියයට 55 ක් පමණ විය.

# සංඛ්‍යා සටහන 3 : වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)

| කාණ්ඩය | 2017 අගෝ. එ.ජ.ඩො. මිලියන | 2018 අගෝ. එ.ජ.ඩො. මිලියන | වෙනස % | 2017 ජන - අගෝ. එ.ජ.ඩො. මිලියන | 2018 ජන - අගෝ. එ.ජ.ඩො. මිලියන | වෙනස % |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **393.8** | **431.2** | **9.5** | **2,950.1** | **3,441.3** | **16.7** |
| ආහාර හා පාන වර්ග | 147.9 | 128.6 | (13.0) | 1,204.5 | 1,148.1 | (4.7) |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය හා ආශ්‍රිත නිෂ්පාදිත | 22.7 | 1.7 | (92.6) | 185.0 | 113.2 | (38.8) |
| එයින් සහල් | 21.3 | 0.4 | (98.2) | 176.4 | 100.9 | (42.8) |
| කිරි නිෂ්පාදිත | 22.9 | 40.9 | 78.3 | 202.9 | 231.2 | 13.9 |
| එළවළු | 32.7 | 25.3 | (22.8) | 235.7 | 220.4 | (6.5) |
| මුහුදු ආහාර | 18.7 | 19.3 | 3.5 | 147.7 | 136.0 | (7.9) |
| කුළුබඩු | 8.0 | 11.0 | 37.6 | 64.3 | 73.1 | 13.7 |
| සීනි හා රසකැවිලි | 19.1 | 8.9 | (53.7) | 188.8 | 180.8 | (4.2) |
| වෙනත් ආහාර හා පාන වර්ග | 23.7 | 21.5 | (9.1) | 180.1 | 193.4 | 7.4 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 245.9 | 302.6 | 23.1 | 1,745.6 | 2,293.2 | 31.4 |
| පෞද්ගලික රථවාහන | 72.6 | 142.7 | 96.5 | 505.0 | 1,092.4 | 116.3 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 44.5 | 49.5 | 11.2 | 334.9 | 349.2 | 4.3 |
| රෙදිපිළි හා උපාංග | 41.1 | 25.1 | (38.9) | 262.3 | 214.6 | (18.2) |
| විදුලි සංදේශ මෙවලම් | 23.1 | 24.6 | 6.4 | 175.0 | 184.7 | 5.5 |
| ගෘහ උපකරණ | 21.3 | 20.6 | (3.2) | 168.2 | 158.7 | (5.7) |
| ගෘහ හා දැව භාණ්ඩ | 20.7 | 14.9 | (28.0) | 119.3 | 112.1 | (6.0) |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 22.5 | 25.1 | 11.6 | 180.8 | 181.4 | 0.4 |
| **2. අන්තර් භාණ්ඩ** | **1,020.8** | **1,061.6** | **4.0** | **7,271.7** | **8,356.8** | **14.9** |
| ඉන්ධන | 312.5 | 398.6 | 27.6 | 2,152.8 | 2,768.8 | 28.6 |
| එයින් බොරතෙල් | 76.9 | 108.9 | 41.6 | 391.1 | 595.3 | 52.2 |
| පිරිපහදු කළ ඛනිජ තෙල් | 232.7 | 289.6 | 24.4 | 1,587.7 | 2,026.2 | 27.6 |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 74.4 | 9.9 | (86.7) | 474.6 | 518.4 | 9.2 |
| එයින් රත්‍රන් | 65.4 | 0.1 | (99.9) | 402.7 | 438.0 | 8.8 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 237.4 | 247.8 | 4.4 | 1,781.3 | 1,857.9 | 4.3 |
| රසායනික නිෂ්පාදිත | 74.9 | 77.4 | 3.2 | 549.9 | 601.9 | 9.5 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 56.6 | 59.9 | 5.9 | 407.9 | 471.7 | 15.6 |
| කඩදාසි හා ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 44.6 | 47.9 | 7.4 | 311.6 | 345.7 | 11.0 |
| මූල ලෝහ | 52.3 | 34.6 | (33.8) | 353.0 | 415.6 | 17.7 |
| ඛනිජ නිෂ්පාදිත | 12.9 | 31.6 | 145.2 | 121.6 | 129.7 | 6.6 |
| ආහාර සැකසුම් | 23.3 | 27.5 | 18.4 | 200.7 | 207.9 | 3.6 |
| තිරිඟු හා ඉරිඟු | 31.3 | 23.9 | (23.6) | 225.2 | 235.9 | 4.8 |
| පොහොර | 14.3 | 14.5 | 1.5 | 64.0 | 153.3 | 139.4 |
| වෙනත් | 86.4 | 87.9 | 1.7 | 629.1 | 650.0 | 3.3 |
| **3. ආයෝජන භාණ්ඩ** | **438.7** | **393.5** | **(10.3)** | **3,237.7** | **3,212.2** | **(0.8)** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 224.3 | 222.7 | (0.7) | 1,738.3 | 1,703.0 | (2.0) |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 153.9 | 134.2 | (12.8) | 1,054.8 | 1,013.0 | (4.0) |
| ප්‍රවාහන උපකරණ | 59.7 | 36.0 | (39.7) | 438.6 | 492.0 | 12.2 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.8 | 0.5 | (29.5) | 6.0 | 4.3 | (29.6) |
| **4. වර්ග නොකළ ආනයන** | **3.6** | **0.8** | **(77.0)** | **137.5** | **72.3** | **(47.4)** |
| **මුළු ආනයන** | **1,856.9** | **1,887.1** | **1.6** | **13,597.0** | **15,082.7** | **10.9** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

2018 වසරේ අගෝස්තු මාසයේ දී සංචාරක පැමිණීම්වල මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා වූ අතර, එය 2017 අගෝස්තු මාසය හා සැසඳීමේදී, වාර්ෂික පදනම මත, සියයට 4.9 ක වර්ධනයක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, වසරේ පළමු මාස අට තුළදී මුළු සංචාරක පැමිණීම් ප්‍රමාණය 1,582,835 ක් වූ අතර, එය සියයට 12.5 ක සමුච්චිත වාර්ෂික වර්ධනයකි. ඒ අනුව, වසරේ පළමු මාස අට තුළ සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 2,935 ක් විය. එක්සත් රාජධානියේ සිට පැමිණි සංචාරකයින්ගේ ප්‍රමාණාත්මක වර්ධනය, අගෝස්තු මාසයේ සංචාරක අංශයේ වර්ධනය සඳහා දායක වූ අතර, මැද පෙරදිග රටවලින් පැමිණි සංචාරකයින්ගේ සැලකිය යුතු අඩු වීමක් ද මාසය තුළදී දක්නට ලැබුණි. මේ අතර, 2018 අගෝස්තු මාසයේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වාර්ෂික පදනම මත සියයට 10.9 ක සැලකිය යුතු අඩු වීමක් වාර්තා කළ අතර, සමුච්චිත පදනම මත සැලකූවිට වසරේ පළමු මාස අට තුළ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේදී සුළු වශයෙන් අඩු විය.

**රූප සටහන 4 : සංචාරක පැමිණීම්හි ප්‍රධාන මූලාශ්‍ර පහ**




**මූලය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**

**රූප සටහන 5 : සංචාරක පැමිණීම්හි ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




**මූලයන් : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය**
**බලපත්‍රලාභී වාණිජ බැංකු**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

## මූල්‍ය ලැබීම්

කොළඹ කොටස් වෙළඳපොළ සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජන යන ද්විත්වයම 2018 වසරේ අගෝස්තු මාසයේදී ශුද්ධ ගෙවීම් වාර්තා කළේය. ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් කොළඹ කොටස් වෙළඳපොළ විදේශීය ආයෝජන, එ.ජ.ඩොලර් මිලියන 6 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2018 වසරේ පළමු මාස අට තුළදී කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ

මුළු විදේශීය ආයෝජන එ.ජ.ඩොලර් මිලියන 44 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළ අතර, එය ද්විතීයික වෙළඳපොළ වෙතින් වූ එ.ජ.ඩොලර් මිලියන 26 ක ශුද්ධ ගෙවීම් සහ ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ එ.ජ.ඩොලර් මිලියන 70 ක ලැබීම්වලින් සමන්විත විය. අගෝස්තු මාසයේ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන ඉවත් කර ගැනීම අඛණ්ඩව සිදු වූ අතර, සමස්තයක් වශයෙන්, 2018 වසරේ පළමු මාස අට තුළදී, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් එ.ජ.ඩොලර් මිලියන 315 ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය.

## ජාත්‍යන්තර සංචිත

2018 අගෝස්තු මස අවසානයේ දී පැවති දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් බිලියන 8.6 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය ආනයනික මාස 4.6 කට සමාන විය. එහි ප්‍රතිඵලයක් ලෙස, දළ නිල සංචිත සහ බැංකු අංශයේ විදේශ වත්කම් ඇතුළත් මුළු විදේශීය වත්කම් ප්‍රමාණය, 2018 අගෝස්තු අවසානය වන විට එ.ජ.ඩොලර් බිලියන 11.0 ක් වූ අතර, එය ආනයනික මාස 5.9 කට සමාන විය.

**රූප සටහන 6 : දළ නිල සංචිත සහ සමස්ත ශේෂය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

2018 වසරේ ඔක්තෝබර් 29 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල, එ.ජ.ඩොලරයට සාපේක්ෂව සියයට 11.6 කින් අවප්‍රමාණය විය. තවද, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල, ඉන්දියානු රුපියල හැර අනෙකුත් ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ද අවප්‍රමාණය විය. සමස්තයක් වශයෙන් ජාත්‍යන්තර වෙළඳපොළ තුළ එ.ජ.ඩොලරය ශක්තිමත් වීම, රාජ්‍ය සුරැකුම්පත් ආශ්‍රිත ගෙවීම් සහ ආනයන ගෙවීම් වෙනුවෙන් විදේශ විනිමය වෙළඳපොළ තුළ පැවති ඉල්ලුම, එ.ජ.ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි අවප්‍රමාණය වීම කෙරෙහි වැඩි වශයෙන් බලපෑවේය.

**රූප සටහන 7 :**

**එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4 :**

**තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2017 | 2018 ඔක් 29 දක්වා අතිප්‍රමාණය (+) / අවප්‍රමාණය (-) |
|---|---|---|
| එ.ජ. ඩොලරය | -2.0% | -11.6% |
| යුරෝ | -13.5% | -7.4% |
| ස්ටර්ලින් පවුම | -10.5% | -7.4% |
| ජපන් යෙන් | -5.1% | -12.4% |
| කැනේඩියානු ඩොලරය | -8.6% | -7.9% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -9.0% | -2.8% |
| ඉන්දියානු රුපියල | -7.5% | +1.3% |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව